<u>ව්‍යුත්පන්න භාවිත</u>

**ඉගෙනුම් ක්‍රියාවලියට අත්වැලක්**

**නිපුණතා මට්ටම 15.1**

1. ශ්‍රිතයක ව්‍යුත්පන්නය ශූන්‍යය වන ලක්ෂ්‍ය ස්ථාවර ලක්ෂ්‍ය ලෙස අර්ථ දැක්වෙයි.
    - $x=c$ හි දී අර්ථ දක්වා ඇති අවකලනය කළ හැකි $f$ ශ්‍රිතයක $f^1(c)=0$ වන සේ වූ $x=c$ ලක්ෂ්‍යය $f$ ශ්‍රිතයේ ස්ථාවර ලක්ෂ්‍යයක් ලෙස අර්ථ දක්වන්න.

      සුදුසු උදාහරණ මගින් මෙය පැහැදිලි කරන්න.
2. ඕනෑ ම $x_1<x_2$ සහ $x_1,x_2\in \mathrm{I}$ විට, $f(x_1)\le f(x_2)$ නම්, $f(x)$ ශ්‍රිතය $\mathrm{I}$ ප්‍රාන්තරය මත වැඩි වන ශ්‍රිතයක් ලෙස පහදන්න.
    - $x\in \mathrm{I}$ සඳහා $\mathrm{f}'(x)>0$ නම්, එවිට $\mathrm{I}$ ප්‍රාන්තරය මත $f(x)$ නිතිමතින් වැඩි වන ශ්‍රිතයක් බව පහදන්න.
    - ඕනෑ ම $x_1<x_2$ සහ $x_1,x_2\in \mathrm{I}$ විට $\mathrm{f}(x_1)\ge \mathrm{f}(x_2)$ නම්, $\mathrm{f}(x)$ ශ්‍රිතය $\mathrm{I}$ ප්‍රාන්තරය මත අඩුවන ශ්‍රිතයක් බව පැහැදිලි කරන්න.
    - $x\in \mathrm{I}$ සඳහා $\mathrm{f}^1(x)<0$ නම්, එවිට $\mathrm{I}$ ප්‍රාන්තරය මත $\mathrm{f}(x)$ නිතිමතින් අඩු වන ශ්‍රිතයක් බව පහදන්න.
3. සියලු $x\in(c-\delta,\ c+\delta)$ සඳහා $\mathrm{f}(x)\le \mathrm{f}(c)$ වන සේ $\delta>0$ පවතී නම් $x=c$ හි දී $f(x)$ ට උපරිමයක් ඇතැයි කියනු ලබන බව ප්‍රකාශ කරන්න.
    - සියලු $x\in(c-\delta,\ c+\delta)$ සඳහා $\mathrm{f}(x)\ge \mathrm{f}(c)$ වන සේ $\delta>0$ පවතී නම් $x=c$ හි දී $f$ ට අවමයක් ඇතැයි කියනු ලබන බව ප්‍රකාශ කරන්න.

---

4. ස්ථානීය උපරිමයක් හෝ ස්ථානීය අවමයක් සෙවීම සඳහා ප්‍රථම ව්‍යුත්පන්න පරීක්ෂාව යොදා ගන්නා ආකාරය විස්තර කරන්න.
5. ස්ථානීය උපරිමයක් හෝ ස්ථානීය අවමයක් හෝ නොවන ස්ථාවර ලක්ෂ්‍යය ද පවතින බව ප්‍රකාශ කරන්න.
    - $f'(c)=0$ වූ පමණින් ම $x=c$ හි දී $f$ ට ස්ථානීය උපරිමයක් හෝ ස්ථානීය අවමයක් නොපවතින අවස්ථා උදාහරණ මගින් සාකච්ඡා කරන්න.
6. නතිවර්තන ලක්ෂ්‍ය හඳුන්වා දෙන්න.

---

7. $f'(a)=0$ සහ $f''(a)>0$ නම් එවිට $x=a$ හි දී $f$ ශ්‍රිතයට ස්ථානීය උපරිමයක් ඇත.

- $f'(a)=0$ සහ $f''(a)<0$ නම්, එවිට $x=a$ හි දී $f$ ශ්‍රිතයට ස්ථානීය අවමයක් ඇත.

  උපරිම සහ අවම ඇතුළත් ගැටලු විසඳීමට සිසුන් යොමු කරන්න.

---

## නිපුණතා මට්ටම 15.2

1. $x \in (a,b)$ සඳහා $f''(x)>0$ නම් එවිට වක්‍රය උඩු අතට අවතල බවත් $x \in (a,b)$ සඳහා $f''(x)<0$ නම් එවිට වක්‍රය යටි අතට අවතල බවත් ප්‍රකාශ කරන්න.

- නති වර්තන ලක්ෂ්‍යයක් යනු එහි අවකලතාව වෙනස් කරන ලක්ෂ්‍යයක් බව පැහැදිලි කරන්න.
- නතිවර්තන ලක්ෂ්‍යක දී ව්‍යුත්පන්නය ශුන්‍ය වීම අවශ්‍ය නොවන බව පෙවීමට උදාහරණ දෙන්න.

---

## නිපුණතා මට්ටම 15.3

1. ඉහත මූලධර්ම භාවිත කර ශ්‍රිතවල ප්‍රස්තාර ඇඳීමට සිසුන් යොමු කරන්න. තිරස් හා සිරස් ස්පර්ශෝන්මුඛ අඩංගු උදාහරණ ද ඇතුළත් ය.

---

## නිපුණතා මට්ටම 15.4

1. උපරිමය සහ අවමය යෙදෙන එදිනෙදා ජීවිතයේ අවස්ථා ඇතුළත් ගැටලු විසඳීම සඳහා සිසුන් යොමු කරන්න.

---